# කරුණා නිරායුද කිරීම හා සාම කතා

ඊනියා සාම සාකච්ඡා සඳහා ජිනීවා නුවරට යෑමට එකඟවී සිටින කොටි සංවිධානය කරුණාගේ කණ්ඩායම නිරායුධ කරන ලෙස ආණ්ඩුවෙන් ඉල්ලා ඇත. ඊනියා සාම සාකච්ඡා සඳහා කොටි එකඟවීම, කෙසේ පෙන්වීමට උත්සාහ කළ ද, බටහිරයන්ගේ බලපෑම මත සිදුවූවක් බව ඉතා පැහැදිලි ය. ඇමරිකා එක්සත් ජනපදවල තානාපතිවරයා කොටින්ට කරන ලද තර්ජන ගර්ජනවල පසුපස වූයේ මේ සාකච්ඡා මිස අන් කිසිවක් නොවෙයි. සුනාමි ආධාර පන්සල්වලට බෙදන සොල්හයිම් උපාසකයකු ලෙස පෙනී සිටිමින් ඇතැම් භික්ෂූන් වහන්සේ ද තමන්ට රිසි අයුරින් මෙහෙයවීමට උත්සාහ දරයි. කලක සිටම පල්ලිය විසින් මෙහෙයවෙන පල්ලි නිකායේ භික්ෂූන් වහන්සේලාගේ ප්‍රධානීන් මේ සම්බන්ධයෙන් උනන්දුවෙන් කටයුතු කරනු දැකිය හැකිය. ඒ කෙසේ වෙතත් කොටි සංවිධානය කරුණා නිරායුධ කරන ලෙස ඉල්ලීම අපට අඩුම තරමින් ප්‍රශ්න තුනක් නිසා වැදගත් වෙයි.

පළමුවෙන්ම ඊනියා සටන් විරාම ගිවිසුම හෙවත් රනිල් ප්‍රභාකරන් ගිවිසුම අනුව, ඒ අත්සන් කෙරී දින තිහක් ඇතුළත කොටි සංවිධානය ආයුධ බිම තැබිය යුතු විය. එහෙත් රනිල් ප්‍රභාකරන් ගිවිසුම අත්සන් කෙරී දින තිහක් නොව මාස තිහකට ද වඩා ගතවූව ද තවමත් කොටි ආයුධ සන්නද්ධවී ඇතිවා පමණක් නොව ඔවුහු දිනෙන් දින තව තවත් ආයුධ මිලදී ගනිති. ඊනියා සටන් විරාම නිරීක්ෂක කණ්ඩායමට මේ සම්බන්ධයෙන් කිසිවක් කිරීමට නොහැකිය. ඔවුන්ට කළ හැක්කේ කොටි සංවිධානය හා ආණ්ඩුව එක මට්ටමකට ඇද දමමින් පුවත්පත් ප්‍රකාශ නිකුත් කිරීම පමණය. තමන් නිරායුධ නොවී කරුණා පාර්ශ්වය නිරායුධ කරන ලෙස කොටි ඉල්ලා සිටින්නේ ඇයි?

සංවිධානාත්මකව රටක ආයුධ දැරීමට හැකිකමක් ඇත්තේ එහි රාජ්‍යයටය. එසේත් නැතහොත් රජය විසින් යම් කාර්යයක් ඉටුකිරීම සඳහා අනුමත කෙරී ඇති ආයතනයකටය. එලෙස ආයුධ දැරීම රාජ්‍ය අනුමැතියට යටත් වෙයි. වෙනත් ආකාරයකට ආයුධ දැරීමට ඉඩක් නැත. කරුණාගේ පාර්ශ්වයට මෙන්ම ප්‍රභාකරන්ගේ පාර්ශ්වයට ද ආයුධ දැරීමට රජය අවසර දී නැත. එවැනි තත්ත්වයකදී ඒ කොටස් දෙකම නිරායුධ කිරීමට කටයුතු කිරීමට රජයට හැකිය. කරුණා පාර්ශ්වය පමණක් නිරායුධ කරන ලෙස කොටි ත්‍රස්තවාදීන් ඉල්ලා සිටින්නේ තමන් ද ආණ්ඩුවක් බව පෙන්වීමට මිස අන් කිසිවකට නොවෙයි. වෙනත් අයුරකින් පවසන්නේ නම් කරුණා පාර්ශ්වය පමණක් නිරායුධ කරන ලෙස කොටි ඉල්ලා සිටින්නේ තමන් උතුරු හා නැගෙනහිර පළාත්වල ආණ්ඩුව බව තහවුරු කිරීමේ චේතනාවෙන් ද බව අමතක නොකළ යුතුය.

අද කරුණා පාර්ශ්වය ආයුධ ගෙන සිටින්නේ ප්‍රභාකරන්ට විරුද්ධව මිස ආණ්ඩුවට විරුද්ධව නොවෙයි. අද මෙරට ආණ්ඩුවට විරුද්ධව වෙනම රාජ්‍යයක් ගොඩනැගීමේ අරමුණින් ආයුධ ගෙන සිටින එකම ත්‍රස්තවාදී සංවිධානය කොටි සංවිධානය වෙයි. රජය කොටි සංවිධානය නිරායුධ කළහොත් කරුණා පාර්ශ්වය කිසිම කරදරයක් නැතිවම නිරායුධ වනු ඇත. එබැවින් කොටින්ගේ ඉල්ලීම පරිදි කටයුතු කරන්නේ නම් ආණ්ඩුව විසින් පළමුව කළ යුත්තේ කොටි නිරායුධ කිරීමය. පල්ලි නිකායේ උපාසකයකු වී සිටින සොල්හයිම් නම් ලූතර්වාදී ක්‍රිස්තියානි භක්තිකයාට වුව ද ඒ බව තේරුම් යා යුතුය. අනෙක් අතට නෝර්වීජියානුවන් හා බටහිරයන් අනුග්‍රහය දක්වන ඔවුන් විසින් කෙටුම්පත් කෙරුණු රනිල් ප්‍රභාකරන් ගිවිසුමට අනුව වුවද (අප ඒ නොපිළිගත්ත ද ඔවුහු පිළිගනිති) කොටි නිරායුධ කළ යුතු වෙයි.

කරුණා නිරායුධ කිරීමට ආණ්ඩුවෙන් කරන ඉල්ලීම නිසා මතුවන දෙවන ප්‍රශ්නය නම් එසේ කිරීමට කොටි ත්‍රස්තවාදී සංවිධානයට නොහැකි ද යන්නය. ලෝකයේ ඉතාම දක්ෂ ඊනියා හමුදාවක් ලෙසත් කැපවීමෙන් ඉතා ඉහළ සංවිධානයක් ලෙසටත් ලංකාණ්ඩුවේ හමුදාවලට පරාජය කිරීමට නොහැකි සංවිධානයක් ලෙසටත්, බටහිර ජනමාධ්‍යය, බටහිර ඊනියා උගතුන්, බටහිර ක්‍රිස්තියානි සංවිධාන හා රාජ්‍ය විසින් නඩත්තු කෙරෙන මෙරට ඊනියා සාම මණ්ඩල, සති අන්ත පත්තර කඩමාළු ද ඇතුළු රාජ්‍ය නොවන ආයතන විසින් පුන පුනා හැදින්වෙන කොටි සංවිධානයට කරුණා පාර්ශ්වය පරාජය කර ඔවුන් නිරායුධ නොකළ හැක්කේ ඇයි? කොටි ත්‍රස්තවාදීන් කරුණා පාර්ශ්වය නිරායුධ කිරීමට රජයේ සහාය පතන්නේ ඇයි? එයට ඇත්තේ එක් හේතුවක් පමණය. ඒ එසේ කිරීමට කොටි ත්‍රස්තවාදීන්ට නොහැකි වීමය. කොටිවත්, ඔවුන් නඩත්තු කෙරෙන බටහිර ක්‍රිස්තියානි රාජ්‍යවත්, මෙරට සිටින ඔවුන්ගේ බත්බැලයන්ගෙන් සමන්විත ඊනියා සාම දූතයෝවත් ඒ බව නොකියති. කරුණා පාර්ශ්වය පරාජය කර ඔවුන් නිරායුධ කිරීමට නොහැකි කොටි ත්‍රස්තවාදීන් අනභිබවනීය බළඇණියක් ලෙස අපට හඳුන්වා දීමට කටයුතු

© Prof. Nalin De Silva

කරන්නන්ගේ පක්ෂපාතීත්වය ඇත්තේ බටහිර ක්‍රිස්තියානි යටත්විජිතවාදීන්ට බව මෙයින් ද පැහැදිළි වෙයි. ඊනියා සමාජවාදයක් ගැන කෙතරම් බෙරිහන් දුන්න ද, මෙරට සිටින මාක්ස්වාදීන්, පශ්චාත්මාක්ස්වාදීන්, පශ්චාත්ව්‍යුහවාදීන්, පශ්චාත්නූතනවාදීන් ඇතුළු අනෙක් පශ්චාත් පාර්ශ්වවාදීන් බටහිර මතවාද යොදා ගැනීමෙන් සේවය කරන්නේ බටහිර ක්‍රිස්තියානි යටත්විජිතවාදීන්ට මිස වෙනත් අයකුට නොවෙයි. කොටි ත්‍රස්තවාදීන් පරාජය කිරීමේ හැකියාව මෙරට හමුදාවට තිබියදී වෙනත් පින්තූරයක් මවා ඇතියවුන්ගේ ජඩසෙළුව මේ සිද්ධියෙන් මනාව පෙනෙයි. අද කළයුත්තේ කොටි සමග ඊනියා සාම සාකච්ඡා ආරම්භ කිරීම නොව හැකි නම් රජයේ හමුදා පරාජය කර උතුරු හා නැගෙනහිර පළාත්වල වෙනම රාජ්‍යයක් බිහිකිරීමට කොටි සංවිධානයට අභියෝග කිරීමය.

කොටි ත්‍රස්තවාදීන්ට එසේ නොකළ හැකි බව මෙරට සිටින අඥබාල සාම බත්බැලයන් නොදනිතත් බටහිරයෝ දනිති. ඊනියා සාම සාකච්ඡාවල එකම අරමුණ කොටින්ට සටන් කර දිනාගත නොහැකි ඊළම සාකච්ඡාවෙන් ලබාදීමට කටයුතු කිරීමය. ත්‍රස්තවාදීන් සමග සාකච්ඡා නොකරන බව කියන්නෝ ද බටහිරයෝ ම වෙති. ඇමරිකා එක්සත් ජනපදය තමන් කිසිදිනෙක බින්ලාඩන් සමග සාකච්ඡා නොකරන බව පවසයි. බ්‍රිතාන්‍ය අයි. ආර්. ඒ. සංවිධානය සමග සාකච්ඡා පවත්වන්නේ ඒ සංවිධානය ආයුධ බිම තබන්නේ නම් පමණකි. ඔවුන්ට සාමය අනවශ්‍ය ද? සාමය අවශ්‍ය අපට පමණක් ද? ඇමරිකාවේ හා බ්‍රිතාන්‍යයේ ක්‍රිස්තියානි පූජකවරු, බිෂොප්ලා, ආච්බිෂොප්ලා, මිනිස්ටර්ලා (මිනිස්ටර් යන වචනය අද ඇමැතිවරුන්ට යෙදුව ද මුලදී ඒ යෙදුවේ ක්‍රිස්තියානි පූජකවරුන්ටය. මේ බටහිර ක්‍රිස්තියානි සංස්කෘතික ආධිපත්‍යය. විශ්වවිද්‍යාලවල පීඨාධිපතිවරුන් හැඳින්වීමට යොදන ඩීන් යන්න ද මුලදී භාවිත වූයේ පල්ලිවලය. එපමණක් නොව රතු කළු ආදී වර්ණ සහිත ඊනියා උපාධි ලෝගුව ද ක්‍රිස්තියානි පූජකවරුන්ගේ තරාතිරම පෙන්වන ඇඳුමේ කොටසක් වෙයි.) ඒ රටවල පාලකයන්ට සාමය ගැන දේශනා නොකරන්නේ ඇයි? සාමය අවශ්‍ය මෙරට ක්‍රිස්තියානි පූජකයන්ට හා පල්ලි නිකායේ භික්ෂූන්ටද? සාම බත්බැලයන් වහා ඇමරිකාවට යවා බින් ලාඩන් සමග සාකච්ඡා කිරීමට බුෂ්ට බල කරන පිකට්ටුවක් ධවල මන්දිරය ඉදිරියේ පැවැත්වීමට කටයුතු කළ යුතුය.

කරුණා පාර්ශ්වය නිරායුධ කිරීමට ආණ්ඩුවට බල කිරීමෙන් මතුවන තුන්වන ප්‍රශ්නය නම් උතුරු හා නැගෙනහිර පළාත්වල රජයට බලාධිපත්‍යයක් ඇති බව කොටි සංවිධානය පිළිගන්නේ ද යන්නය. කොටි කරුණා පාර්ශ්වය පරාජය කිරීමට බටහිරයන්ගෙන් නොඉල්ලති. ඔවුන් ඒ ඉල්ලීම කරන්නේ ආණ්ඩුවෙන්ය. එසේ නම් කොටි ත්‍රස්තවාදීහු දැනටත් ඒ පළාත්වල රජයේ බලාධිපත්‍යය පිළිගනිති. ඔවුන්ට අවශ්‍ය ආණ්ඩුව ලවා කරුණා පරාජය කර ඉන්පසු සොල්හයිම් ඇතුළු බටහිරයන්ගේ මාර්ගයෙන් සාකච්ඡා මේසය හරහා ඊළම දිනාගැනීමට කටයුතු කිරීමය. අප මෙයට ඉඩදිය යුතු නොවෙයි. බටහිර ක්‍රිස්තියානි රාජ්‍යවල වුවමනාවට සාමය ද යුද්ධය ද යනුවෙන් දෙමළ ජාතිවාදයේ බෙදුම්වාදී ප්‍රශ්නය ලඝු කිරීමට තැත් කරන සාම බත්බැලයන්ගේ සියලු ප්‍රචාරක හරඹ පරාජය කරමින් මෙරට සිංහල ජනතාවගෙන් අතිමහත් බහුතරය මහින්ද රාජපක්ෂ මහතාට ඡන්දය දුන්නේ ජිනීවා යෑමට නොවන බව මතක් කළ යුතුය. ජනාධිපතිවරණයේදී මහින්ද චින්තනයට විරුද්ධ වූවෝ, විශේෂයෙන්ම සාම බත්බැලයෝ හා ඇංකරයෝ, අද රජය මෙහෙයවති. ශ්‍රීලනි පක්ෂයේ නායකත්වය තවමත් බටහිර ක්‍රිස්තියානි ආධිපත්‍යයට නැඹුරුවේ නම් එයට හේතුව මහින්ද රාජපක්ෂ මහතා මහින්ද චින්තන මත පදනම් වී බටහිරයන්ට ද අභියෝග කරමින් ඉදිරියට නොයෑමය. සිත ඇත්නම් බටහිරයන්ට අභියෝග කිරීම මහා කාරියක් නොවන බව තවත් ථෙරවාදී බෞද්ධ රටක් වූ මියන්මාරය කදිමට පෙන්වා දී ඇත.

රනිල් ප්‍රභාකරන් ගිවිසුම අපි ප්‍රතික්ෂේප කරමු. ඉහත සඳහන් වැකි ලියා ඇත්තේ ඒ පාවාදීමේ ගිවිසුම ක්‍රියාත්මක කිරීමට නොව තර්කය සඳහාය. ඒ ගිවිසුම ප්‍රතික්ෂේප කර ජනතාව අනුමත කළ මහින්ද චින්තන පෙරට ගත යුතුය. මහින්ද චින්තන අනුව කොටි ත්‍රස්තවාදීන් සමග සාකච්ඡා කිරීමට පෙර ඔවුන් නිරායුධ විය යුතුය. එමෙන්ම කොටි බෙදුම්වාදය ප්‍රතික්ෂේප කළ යුතුය. සාම සාකච්ඡා යනු ඊනියා යථාර්ථයක් හෝ කසිකබල් ලකානියානු යථාර්ථයක් (රියල්) හෝ නොවෙයි. ඊනියා යථය ද මනසින් තොරව පවතින බවක් මනසින් තොරව පෙන්වාදිය හැකි ලකානියකු හෝ ඊනියා අනෙකකු හෝ නැත. මේ ඊනියා යථාර්ථය යනු බටහිර ක්‍රිස්තියානි යටත්විජිතවාදයේ අල්තාරය ඉදිරියේ දණගැසීමය.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva